## 2017 සැප්තැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. තිරිඟු බීජය පොළොවෙහි වැටී නොමළොත් එය තනි බීජයක් පමණක් වේ. එහෙත් එය මළොත් සරු ලෙස පල දරයි. "** (ශු.ජොහාන් 12:24)

පසුගිය මාසය තුළ අයැදීමේ සහ මැදිහත්වීමේ සේවකයන් වශයෙන් ඔබත් මමත් **"එතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න"** යන තේමාව ඔස්සේ සමස්ථ පුබුදු ජනතාවද, සමස්ත කිතුනු ජනතාවද ඒ වචනයට ඇතුළු වෙමින් ඒ අත්දැකීමට ශුද්ධාත්ම වරම් ලැබෙන ලෙස අයැදීමටත් ඔබටත් මටත් ඒ අත්දැකීමට ඇතුළු වීමට හැකි වූවායැයි අපගේ විශ්වාසයයි. අපි නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන්ට අවදි වනවා නම් ඒ වඩාත් ඵල දැරීමට හේතුවක් වන බව අනුමානයක් නැත. මේ මාසයේදී අපට ලැබෙන්නේ ඉතාමත් අභියෝගාත්මක වචනයකි. එනම්, **"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි; තිරිඟු බීජය පොළොවහි වැටී නොමළොත් එය තනි බීජයක් පමණක් වේ. එහෙත් එය මළොත් සරු ලෙස පල දරයි."** යන වචනයයි. මේ වචනය සෑම කිතුනුවෙකුටම ප්‍රසාද ස්නාපනය සහ අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව තුළින් ලැබෙන විශේෂ වරමකි. දුක් විඳීමෙන් සහ පීඩා විඳීමෙන් තොරව සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයෙකු විය නොහැකිය. එබැවින් මේ මාසය පුරාවටම අපි මැසිවිලි නොකියා අපට මුහුණ දීමට සිදුවන සියළුම පීඩා ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය සහ උත්ථානයට සහභාගි වීමට සක්‍රමේන්තුවක් කර ගනිමු. එමෙන්ම පුබුදු ජීවිතය ගත කරන සියළු දෙනාටම මෙන්ම සමස්ථ කිතුනු ජනතාවට වඩ වඩාත් මේ යථාර්ථයට ඇතුළු වීමට අවැසි ශුද්ධාත්ම බලය පතා මැදිහත් වෙමින් යාච්ඤා කරමු.

**"ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීමට පංගුකාරයන් වන තරමට ප්‍රීති වන්න. මෙසේ ඔවුන් වහන්සේගේ තේජාන්විත එළිදරව් වීමේදී ඔබ ප්‍රීතියෙන් ප්‍රමුදිත වනු ඇත."** (1පේදුරු 4:13)

පළමු සතිය : දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 12:20-26

අයැදීමට විශේෂ යොමුව :

කිතුනුකම නිසා පීඩා විඳින සියළුම ජනතාව වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා දැනටමත් සුවය ලබමින් සිටී. එතුමන් වෙනුවෙන් ප්‍රශංසා කරන අතර, එතුමාට තව තවත් දිව්‍යමය සුවය ලැබෙන ලෙස යාච්ඤා කරන්න.
* පුබුදු දිවැසි එකතුව, සහයක එකතුව, සුසමත එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* විදේශ රටවල පුබුදු සංඝයක් සහ එහි වගකීම ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* සැප්තැම්බර් 1,2,3,4,5 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන බයිබල් ඥානකාන්තිය වෙනුවෙන්, වචනයේ සේවකයින් සහ සහභාගි වීමට නියමිත ජනතාව වෙනුවෙන්.
* ඩෙංගු ඇතුළු වසංගත රෝගයන්ට තුඩු දෙන කැලි කසල තැන් තැන්වල දැමීම සහ පොලිතින් ප්ලාස්ටික් ඇතුළු නොදිරන ද්‍රව්‍යන්ගෙන් පරිසරයට සිදුවන හානිය වලක්වා ගැනීමට රජය සහ මහජනතාව ගන්නා උත්සාහය මල්ඵල දරණ ලෙස.
* දිගු කාලයක සිට 'සයිටම්' පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුද්ධව විශ්ව විද්‍යාල සිසුන් ඉදිරිපත් කරන විරෝධයට නිසි පිළිතුරු ලැබෙන පිණිස.

දෙවන සතිය : දිව්‍යමය කියවීම - 1පේදුරු 4:12-19

අයැදීමට විශේෂ යොමුව :

හෘද්‍යාබාධ, පිළිකා, වකුගඩු ආදි දිගු කාලීන රෝගවලින් පීඩා විඳින සියළුම රෝගීන් වෙනුවෙන් සහ එම රෝගයන්ට හේතුවන කෘතිම රසකාරක සහ කෘමිනාශක යෙදූ ආහාර පරිභෝජනයෙන් ජනතාව ආරක්ෂා වන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* සැප්තැම්බර් 9-10 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගි වන අය සහ උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්.
* මත්පැන්, මත් ද්‍රව්‍ය වලට වහල් වී සිටින සියළු දෙනා සහ මත් ද්‍රව්‍ය ජාවාරම් කරුවන් නීතියේ රැහැනට හසුවන පිණිස.
* ගොවියන්, ධීවරයන්, වඩුවන් කර්මාන්ත ශාලාවල අඩු වැටුපට සේවයේ යෙදෙන සියළුම සේවක සේවිකාවන් සහ කම්කරුවන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ......

තෙවන සතිය : දිව්‍යමය කියවීම - 1 පේදුරු 3:13-19

අයැදීමට විශේෂ යොමුව :

නොරොච්චෝල තාප බලාගාරය නිසා ඒ අවට ජීවත් වන ධීවරයන් සහ ගොවීන්ට ඇති වී තිබෙන පීඩාවෙන් ඔවුන් මුදන පිණිසත්, එම කර්මාන්ත ශාලාවෙන් පරිසරයට ඇතිවන විනාශය වැලැක්වීමට බලධාරින්ට නිසි ක්‍රියා මාර්ග ගැනීමට අවැසි ප්‍රඥාව ලැබෙන පිණිසත්.

(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළුම දෙනා වෙනුවෙන්.
* සැප්තැම්බර් මස 23 වන දින ප්‍රශංසාරාමයේ පැවැත්වෙන පුබුදු ජාතික මව් රැළිය වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.......

සතරවන සතිය : දිව්‍යමය කියවීම - 1පේදුරු 1:6-9

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* ප්‍රබෝධයේ සංඝයෙන් දියත් කර ඇති වැඩ සටහන් සහ ඇති කරගත් ආගමික සමගි සංධාන වැඩපිළිවෙල තුළින් රට තුළ ධර්මයට මුල් තැන දෙන පරිසරයක් ඇතිවන පිණිස.
* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු සියළුම පූජක, පැවිදි, ගිහි ධර්මදූත සේවාවේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .......

**"ඔබ කැඳෙව් තැනැන් වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් ඔබ ද, ඔබගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටින්න. මන්ද, මා ශුද්ධව සිටින හෙයින්, ඔබත් ශුද්ධව සිටිය යුතුය"යි ශුද්ධ ලියවිල්ලෙහි සඳහන්ව ඇත.** (1පේදුරු 1:15-16)

සැලකිය යුතුයි :

* සිකුරාදා දිනය යාච්ඤාවේ සහ උපවාසයේ දිනයක් ලෙස ගත කරන්න.
* ප්‍රශංසාරාමයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභිමුව කෙරෙන අඛණ්ඩ යැදුමට ඔබත් හැකිනම් මසකට වතාවක්වත් සහභාගි වන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -